
# අවවාද පිළිගනිමු



කතාව හා චිත්‍ර

උෂාංදී සමද්‍යා අතුකෝරල

කෘතියේ නම : අවවාද පිළිගනිමු

ප්‍රථම මුද්‍රණය : 08-02-2025

කතාව හා චිත්‍ර : උත්‍රාදි සමද්‍යා අතුකෝරල

පාසල : මහාමායා බාලිකා විදුහල

ශ්‍රේණිය : 3 ශ්‍රේණිය D

ISBN අංකය : 978-6240208-745-0

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදුන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණි"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,


මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.






# පිදුම

මේ පොත ලොකුඅත්තාට..





ඇත ඉදිමිලා හොඳටම
රිදෙනවා. මට  කාමරයෙන්
එළියට ඇවිත් ගෙදර අය දිහා
බලන්නත් ලැජ්ජයි.



නිවාඩු කාලයේම කළේ ගෙදර අයට කරදරමයි. අම්මා "නංගිට කරදර කරන්න එපා" කියනවා. "නංගි පොඩියි. එකතුවෙලා සෙල්ලම් කරන්න". මට ඒවා ඇහෙන්නේ නෑ. නංගිට රිදවනවා.



ගන්න ගන්න පොත පුටු උඩ. ඇඳුම් හැමතැනකම. සෙල්ලම් බඩු ගේ පුරාම. එහෙම කරද්දි මට හරිම සතුටුයි. මම කරන දේ ලොකුඅත්තා දකිනවා.



“ගන්න දෙයක් තිබුණ තැනින් තියන්න.”
“කිළිටි ඇඳුම් කූඩයට දාන්න.”
“පොත් රාක්කයේම තියන්න”.
ලොකුඅත්තා කියලා දෙනවා.
“ලොකුඅත්තගෙ කතා මට ඕන නැහැ”
මම ආඩම්බරයෙන් කියනවා.



ලොකුඅත්තා රූපවාහිනිය බලනවා.
මම ඉස්සරහට පැනල කෑගහනවා.
එහෙට මෙහෙට දුවනවා.
"සද්ද නොකර වාඩිවෙන්න" ලොකුඅත්තා කියනවා.
"ඉස්කෝලෙ පොත් වල වැඩ කරන්න".
ලොකුඅත්තා කියන දේවල් මට ඇහෙන්නේ නෑ වගේ ඉන්නවා.



NEWS

රූපවාහිනිය වහලා ලොකුඅත්තා කාමරේට ගියා.
මම එතනම ඉන්නවා. පුටු උඩ නගිනවා.
පුටුවෙන් පුටුවට පනිනවා. කකුල් උඩට හිස පහළට දැම්මා.
හරිම විනෝදයි.

ලොකුඅත්තා ආවා. “ඔයා වැටෙයි.
පුටුවෙන් බිමට බහින්න. ඔයාට අනතුරක් වෙයි”.
මට කියනදේ අහන්න හිතෙන්නෙම නැහැ.



එකවරම මම පුටුවෙන් ලිස්සලා බිමට වැටුණා. නැගිට්ටින්න හැදුවා නැගිට්ටින්න බැහැ. අත හොඳටම ඉදිමිලා. ලොකුඅත්තා දුවගෙන ආවා. පරිස්සමෙන් ඔසවලා පුටුවේ හාන්සි කළා.



ඉවසන්න බැහැ හරිම වේදනාවක්.

තළලෙන් ලේ ගලනවා. එක කකුලක් රිදෙනවා.



අත ඉදිමිලා හොදටම රිදෙනවා.
ඉවසන්න බැහැ.



ගෙදර හැමෝම එකතුවෙලා මාව රෝහලට ගෙන ගියා. අප්පච්චි මාව වඩාගෙන ගෙදර ගෙනාවා. අම්මටත් හරිම දුකයි.



රාහුල පොඩි හාමුදුරුවෝ වැලි දෝතක් අරන් අවවාද ඉල්ලපු විදිහ මට මතක් වුණා.

"මේ වැලි වලටත් වඩා අද අවවාද ලැබේවා" කියා කරපු පැතුම, පොඩි අපට ඒ කතාව කොතරම් හොඳට ගැළපෙනවාද.



නිමි.

# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.
මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.
මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගලපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසග, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාශිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්